2019. 10. 14 ලංකාදීප

# රුපියල ස්ථාවරයි

## මහ බැංකු අධිපති

(හර්ෂණ තුෂාර සිල්වා)

යම් යම් බලපෑම් තිබුණ ද මේ වසරේ ගත වූ කාලයේදී ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය ඉහළ ගොස් ඇතැයි ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා පැවැසීය.

විවිධ හේතූන් මත සැප්තැම්බර් මාසයේදී රුපියලේ අගය පහත වැටුණු නමුත් පසුගිය සතිය වනවිට රුපියල ස්ථාවර වූ බවද ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා කීය.

පසුගිය සතිය තුළ දී රුපියල ස්ථාවර වුවත් ඉදිරියේදී ද ඊට බලපෑම් එල්ල විය හැකි යැයි මහ බැංකු අධිපතිවරයා කීය.

මේ අතර ශ්‍රී ලංකා මහ බැංකුව සතිපතා නිකුත් කරන දත්තවලට අනුව මේ වසරේ දී ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය සියයට 1.3කින් ඉහළ ගොස් ඇත.